# මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන,
පාසල් යටිතල පහසුකම්, අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

Early Childhood Development Project

# මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීම - 2021/22

ලෝක බැංකුවේ මූල්‍ය ණය ආධාර මත ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සති දෙකක නේවාසික පුහුණුවක් තුළින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කොළඹදී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුහුණු වැඩසටහන 2021/22 වසර තුළ ජාතික අධ්‍යාපන ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සම්පත්දායීන්ගේ සහයෝගයෙන් වැඩසටහන පවත්වනු ලැබේ. මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මෙම වැඩසටහන සංවිධානය කරන අතර වැඩසටහන අවසන් වීමෙන් පසු පුහුණුවන්නන් පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරියන් සඳහා දින හතක මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පුහුණුවක් ලබාදිය යුතුවේ. මෙම පුහුණුව ක්‍රියාත්මක කිරීමේ දී සම්පත්දායී ගාස්තු රජයේ චක්‍රලේඛයන්ට අනුකූලව හා සේවය ලබාදෙන පැය ගණන අනුව ගෙවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම්**

- අධ්‍යාපනය හෝ සමාජ විද්‍යාව හෝ මනෝවිද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක්

  හා

  මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ මුල් ළමාවිය සංවර්ධනය සහ ප්‍රාථමික අධ්‍යාපනය හෝ ඊට සමාන ක්ෂේත්‍රයක උසස් සහතිකයක්

**පළපුරුද්ද**

- මුල් ළමාවිය සංවර්ධනය සහ ප්‍රාථමික අධ්‍යාපනය සහ පෙර පාසල් ගුරු පුහුණුව පිළිබඳ අවම වශයෙන් වසර එකක පළපුරුද්ද

**අමතර සුදුසුකම්**

- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව සහ චතුර බව
- සෞඛ්‍ය, පෝෂණය, ළමා අයිතිවාසිකම්, මනෝවිද්‍යාව සහ උපදේශනය වැනි සමාන විෂයයන් පිළිබඳ වෙනත් පුහුණුවක් අමතර සුදුසුකමක් විය හැකි ය.

**පොදු තොරතුරු**

අයදුම් කිරීමට උනන්දුවක් දක්වන්නන්ට මෙම දැන්වීම පළ කර දින 10ක් ඇතුළත පහත ලබා දී ඇති ලිපිනයට විද්‍යුත් තැපැල්, ෆැක්ස් හෝ ලියාපදිංචි තැපැල් හරහා තම අයදුම්පත එවිය හැකි අතර, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්, සෙත්සිරිපාය 2 අදියරේ මුල් ළමාවිය සංවර්ධනය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම්, අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේදී සම්මුඛ පරීක්ෂණයකට බඳුන් කරනු ලැබේ.

- මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට අයදුම් කිරීමට අපේක්ෂා කරන්නන්ට අපගේ වෙබ් අඩවියෙන් මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩසටහන් සම්බන්ධව වැඩි දුර තොරතුරු ලබා ගත හැකි ය. **www.earlychildhood.gov.lk**


**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මුල් ළමාවිය සංවර්ධනය ව්‍යාපෘතිය,**
**කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම්,**
**අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය,**
**6 වන මහල,**
**සෙත්සිරිපාය 2 අදියර,**
**බත්තරමුල්ල.**
**ෆැක්ස් : 0112186169 /0112193201**
**ඊමේල් : info.ecdptraining@gmail.com**
**වෙබ් අඩවිය : www.earlychildhood.gov.lk**